# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SGLG/RT/A/EMUC/FA/$A_3$/05/2023/03

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 අප්‍රේල් 05 දින.


ලේකම්,

ඇඹිලිපිටිය නගර සභාව.

**ඇඹිලිපිටිය නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ඇඹිලිපිටිය නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මහවැලි අධිකාරිය මගින් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය වෙත 2017 වර්ෂයේදී පවරා දී තිබුණු ඇඹිලිපිටිය නව නගරයේ ආර්ථික මධ්‍යස්ථානය පිහිටි ඉඩම නගර සභාවේ වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ජංගම නොවන වත්කම් රු.15,993,900කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) 2020 හා 2022 වර්ෂවල සිදුකරන ලද ඉදිකිරීම 03ක් ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.2,991,752ක් අඩුවෙන් දැක්වුණි.

(ඇ) ඉඩමක් පවරා ගැනීම සඳහා ගෙවන ලද රු.318,700ක් ඉකුත් වර්ෂයේදී ප්‍රාග්ධනිත කර තිබුණි. එහෙත් එම ඉඩම පවරා ගැනීමට නොහැකි වීම නිසා ආපසු ලද එම මුදල ආදායමට බැර කර තිබුණ ද වත්කම්වලින් ඉවත් කිරීම ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී කඩා ඉවත් කර තිබුණු වාහන නවතා තැබීමේ අංගනයේ වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකිරීම නිසා ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.410,303ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.851,000ක් වටිනාකමැති පරිගණක උපාංග ප්‍රාග්ධනිත කර නොතිබීම නිසා ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් වෙන්කිරීම සිදුකර නොතිබුණි.

(උ) වැටුප් ප්‍රතිපූර්ණය සඳහා රු.4,626,023ක් 2023 දෙසැම්බර් 29 දින සභාවේ ගිණුමට බැර කර තිබියදී, එම වටිනාකම ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු දෑ එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) පොදු ගිණුමෙන් නාගරික සංවර්ධන අධිකාරී ගිණුමට මුදල් මාරුකිරීම වියදමක් සහ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ පුනරාවර්තන ආදායම හා වියදම රු.4,500,000ක් වැඩියෙන් දැක්වුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක තොගය රු.1,313,622ක් සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබීමෙන් සමාන වටිනාකමින් මෙහෙයුම් අතිරික්තය වැඩියෙන් හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (5) | ඔරලෝසු කණුව අලුත්වැඩියාව සඳහා 2017 වර්ෂයේදී ලබාදී තිබූ රු.150,000ක අත්තිකාරම පියවා නොතිබුණි. |
| (ආ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභීන්ට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,752,687ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,452,472ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,516,000 | 19,498,383 | 25,412,093 | 56,414,123 | 18,303,000 | 19,456,728 | 13,686,874 | 61,541,824 |
| කුලී | 26,166,600 | 15,013,014 | 16,639,562 | 3,487,716 | 25,334,200 | 11,746,140 | 13,042,383 | 6,131,941 |
| බලපත්‍ර ගාස්තු | 3,783,500 | 4,385,339 | 4,332,839 | 211,500 | 3,156,500 | 1,891,797 | 1,766,796 | 589,000 |
| වෙනත් ආදායම් | 11,285,700 | 12,764,873 | 6,692,136 | 10,000 | 10,089,700 | 7,390,232 | 6,924,468 | - |
| | 59,751,800 | 51,661,609 | 53,076,630 | 60,123,339 | 56,883,400 | 40,484,897 | 35,420,521 | 68,262,765 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.68,262,765ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම රු.51,661,609ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.119,924,374ක් වුවද, රැස් කරන ලද ආදායම රු.53,076,630ක් වීමෙන් තවදුරටත් රැස්කර ගතයුතු සමස්ථ ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 56ක මට්ටමක පැවැතිණි.

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු සහ සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 37කින්, 15කින් සහ 17කින් වැඩි වී තිබුණු අතර, බදු කුලී ආදායම වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් සහ රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 36කින්, 67කින්, 51කින් සහ 28කින් අඩුවී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

------------------

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.56,414,123ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.43,391,747ක් වූ වරිපනම් ඒකක 7,631ක් ඇතුළත් වී තිබුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි.

2.2.4 කුලී

----

වසර 04ත් වසර 15ත් අතර කාලයක් හිඟහිටි කඩකාමර කුලී රු.3,033,281ක් අයකර නොතිබුණි. එමෙන්ම, බස් නැවතුම්පල කඩකාමර 22ක් සඳහා ගිවිසුම්ගතවීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

------------------

සභා බල ප්‍රදේශය තුළ පැවති 105ක් වූ මුළු ත්‍රීරෝද රථ සංඛ්‍යාවෙන් ත්‍රීරෝද රථ 45ක්ම 2023 වර්ෂය වෙනුවෙන් වූ රු.22,500ක ගාස්තු ගෙවීම් පැහැර හැර තිබුණි. එමෙන්ම, 2023 වර්ෂය ද ඇතුළුව ඉකුත් වර්ෂ 05ක් වෙනුවෙන් රු.520,000ක ගාස්තු හිඟහිටිව පැවැතිණි. ත්‍රීරෝද රථ සංගමය හා නගර සභාව අතර පැවති සියලු සාකච්ඡා නිශ්චිත එකඟතාවකින් තොරව අවසන් වී තිබීම මෙයට හේතුව වී තිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.290,914ක් හා මුද්දර ගාස්තු රු.10,050,695ක් 2024 මාර්තු වන විටත් ලැබී නොතිබුණි.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මසකට රු.65,860ක කුලියකට බද්දට දී තිබුණු සභාව සතු ගොඩනැගිල්ලක් ඉදිරිපස බදුකරු විසින් අනවසර ඉදිකිරීමක් සිදුකර තිබුණ ද, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ සැලසුම් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. එහෙත්, සමාලෝචිත වර්ෂයේදී මාර්ග 02ක් අලුත්වැඩියා කිරීම සඳහා රු.1,134,305ක් වටිනාකමැති කොන්ත්‍රාත් ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. මහජන සෞඛ්‍ය හා පොදු උපයෝගිතා සේවා පිළිබඳ සැලසුම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණ ද, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සංඛ්‍යාත්මක වශයෙන් ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම සඳහා සැලසුම් කර තිබුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දුර්වල තත්ත්වයක පැවැතිණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ඇඹිලිපිටිය මිද්දෙනිය පාරේ පිහිටි ගොඩනැගිල්ලක ඉදිරිපස පැති බැම්ම හා මිදුල, පූර්ව දැනුම් දීමකින් තොරව 2012 සැප්තැම්බර් 24 දින කඩා ඉවත් කර තිබීම නිසා එහි හිමිකරු විසින් නගර සභාව සහ එහි සභාපති විත්තිකරුවන් ලෙස නම් කරමින් 2013 ජනවාරි 16 දින ඇඹිලිපිටිය දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි. පැමිණිලිකරුට අයත් දේපල තුළ සිදුකර තිබුණු වැඩිදියුණු කිරීම් නීත්‍යානුකූල නොවන අයුරින් නගර සභාව විසින් ඉවත් කර ඇති බව නිගමනය කර තිබුණු දිසා අධිකරණය සිදුව ඇති අලාභය වෙනුවෙන් රු.750,000ක මුදලක් සහ නඩු ගාස්තු නගර සභාවෙන් අයකර ගැනීමේ හිමිකම පැමිණිලිකරුට ඇති බවට 2022 ජනවාරි 28 දින තීන්දු කර තිබුණි. ඒ අනුව 2023 අගෝස්තු 04 දින සභාව විසින් රු.750,000ක් පැමිණිලිකරු වෙත ගෙවා තිබුණු අතර, එම නඩුවේ නඩු ගාස්තු වශයෙන් රු.226,600ක් සභාව වැයකර තිබුණි. අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සඳහා නගර සභා ආඥා පනතේ 77 වගන්තිය මගින් බලය දී තිබුණද, පූර්ව දැනුම් දීමකින් තොරව හා නීත්‍යානුකූල නොවන ආකාරයෙන් එම කාර්යය සිදුකර තිබීම නිසා සභා අරමුදලට රු.976,600ක පාඩුවක් සිදුව තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නිෂ්ක්‍රීය වත්කම්

නොදිරන කසළ මධ්‍යස්ථානය වෙත තෙකලා විදුලිය සපයා ගැනීමට නොහැකිවීමෙන් 2022 ජූලි මස පරිත්‍යාග ලෙස ලද රු.950,000ක් වටිනා බෙලර් යන්ත්‍රය 2023 දෙසැම්බර් වන විටත් සභා භූමිය තුළ නිෂ්කාර්යයව පැවතිණි.

(ආ) වාහන උපයෝජනය

අංක 05/2020 හා 2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (අ) සහ (ආ) ඡේද අනුව 2020 දෙසැම්බර් 31 දිනට පෙර සිදුකළ යුතු, ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති වාහනයක අපහරණය කටයුතු 2023 දෙසැම්බර් මාසය වනතුරුත් අවසන් කර නොතිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

---

නගර සභා නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ වැය විෂයයන් 24කට අදාළව ඉටු නොකළ වැඩ, පිරිවිතරවලට අනුකූල නොවූ වැඩ හා නිවැරදි රේටයන් යොදා නොගැනීම හේතුවෙන් රු.581,643ක් වැඩියෙන් ගෙවා තිබුණි. එමෙන්ම, එහි විදුලි තැනැදීමේ කාර්යය සඳහා වැඩ විෂයයන් 03කට අදාළව රු.174,127ක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම කර්මාන්තය සඳහා ඇස්තමේන්තු සැකසීමේදී, සබරගමුව පළාත් ගොඩනැගිලි රේට (BSR) භාවිතා නොකර, ඒ සඳහා බස්නාහිර පළාත් රේටයන් භාවිතා කර තිබීම මෙන්ම නිශ්චිතව ඇස්තමේන්තු කළ හැකි අයිතම 03ක් සඳහා එකතුව රු.3,800,000ක් Provisional Sum ලෙස ඇස්තමේන්තු කර තිබීම විගණනයේදී ප්‍රශ්නගත විය. ගොඩනැගිල්ලේ අභ්‍යන්තර වෙන්කිරීම් හා දොරවල් සඳහා bottom portion ලෙස polyester coated aluminum sheet වෙනුවට cladding (ක්ලැඩින්) board භාවිතා කර තිබුණ ද ඒ සඳහා ගාස්තු අඩුකර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

අයවැය පාලනය

---

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 28කට අදාළව එකතුව රු.7,673,215ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 42කට අදාළව එකතුව රු.56,633,065ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

ටී.පී.එම්. කුමානායක.

ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.